**කටුනායක සීදුව නගර සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය ව්‍යාවනය

නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.3 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය අවසානයට අසම්භාව්‍ය බැරකම් ලෙස දක්වා තිබූ රු.12,363,015 ක් වූ හිඟ සේවක අර්ථ සාධක දායක මුදල් සමාලෝචිත වර්ෂයේ නිරවුල් කර තිබුණද එය ගිණුම්වලට ගලපා නොතිබූ අතර තවත් සේවකයන් 26 දෙනෙකු වෙත ගෙවීමට සිදුව ඇති හිඟ සේවක අර්ථ සාධක දායක මුදල් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදිව ගැලපීම කළ යුතු වේ. | තවත් සේවකයන් කිහිප දෙනෙකුට අර්ථසාධක දායක මුදල් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුවන බැවින් එම අගය නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි නිසා වර්ෂය තුළ ගෙවන ලද අර්ථසාධක දායක මුදල අසම්භාව්‍ය ගිණුමට ගැලපීම් නොකර අසම්භාව්‍ය බැරකම් ගිණුම ඉදිරියට පවත්වාගෙන යාම සිදු කර ඇති බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති භෞතික තොගය අගය කර ගිණුම් ගත කිරීමකින් තොරව වටිනාකම රු.10,018,436 ක් වූ පොත් අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | භෞතික තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට භෞතික තොග ගණනයක් කිරීම දුෂ්කර බැවින් ලෙජරයේ ශේෂ ගිණුමට ඇතුලත් කර ඇති බව දන්වමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීමේ ගිණුම් පාස්පොත් අනුව සේවක ඇප ආයෝජන රු.124,281 ක් | වර්ෂය තුළ කරන ලද මුළු ඇප ආයෝජනය ගිණුම්ගත කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පොළී සටහන් තබා ගැනීමෙන් පසු බැංකුවෙන් ලැබී ඇති පොළී ප්‍රමාණය |

| | | | |
|---|---|---|---|
| | වූවත් මූල්‍ය ප්‍රකාශනවල රු.43,587 ක් ලෙස දක්වා තිබීමෙන් රු.80,694 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | | සේවක ඇප තැන්පත් ගිණුමට ගැලපීමට 2019 අවසාන ගිණුම්වලදී කටයුතු කළ හැකි බව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ පිරිවැය රු 652,174 ක් වූ විදුලි ජනන යන්ත්‍රය ප්‍රාග්ධනිත කිරීමේදී එහි එකතු කළ අගය මත බදු මුදල වූ රු.97,826 සමඟ රු.750,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | එකතු කළ අගය මත බදු ප්‍රාග්ධනිත නොකළ යුතු වේ. | ප්‍රාග්ධනිත කර ඇති වැඩිපුර අගය වූ රු.97,826 ක් 2019 වර්ෂයේ නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (v) | රු.507,387 ක් වටිනා පුස්තකාල පොත් තොගයක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම පමණක් ගිණුම්ගත කළ යුතු වේ. | වැඩිපුර ප්‍රාග්ධනිත කර ඇති පුස්තකාල පොත් තොගය 2019 අවසාන ගිණුම් වලදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 07 ක ශේෂයන් හා උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.16,044,075 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීම් කරන බව දන්වමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට පැවත එන රු.12,051,288 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ වෙනස්කම් හදුනාගෙන නිවැරදිව ගැලපීම් කළ යුතු වේ. | මෙම ශේෂ වෙනස ඉදිරියේදී සොයාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ලැබිය යුතු ගිණුම් | | |
| 2008 වර්ෂයේ සිට පැවත එන රු.61,870 ක් වූ අගරු චෙක්පත් ගිණුමේ හර ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට ද හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඒ පිළිබඳ තවදුරටත් සොයා බලා නිවැරදි කිරීමට පියවර ගනිමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

--------------------

| | | |
|---|---|---|
| • සේවක ඇප තැන්පත් ශේෂය තුළ ඇතුළත් වර්තමානයේ සභාවේ සේවය නොකරන සේවකයින් 06 දෙනෙකුට අදාල ඇප මුදල් රු 28,165 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවකයන් ඉවත් වීමේදී සේවක ඇප තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉල්ලීම් ලිපි ලබා ගැනීම හා අදාළ ගොනු සොයා විස්තර ලබාගෙන ඉදිරි කටයුතු කරන බව දන්වමි. |
| • වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම පැවත එන රු 1,534,700 ක් වූ ඇස්තමේන්තු වාරික ප්‍රාග්ධන වියදම සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම ශේෂය ජල තැන්පතු - නව ඇස්තමේන්තු වාරික ගිණුමට බැර කිරීමට කටයුතු කරමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.15,957,253ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය / සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. | වරිපනම් කපා හැරීම් තුළ ඇති 2018 වර්ෂයට අදාළව රු.17,996 ක් ආදායම් පරීක්ෂක වරුන්ගේ නිර්දේශ හා සභාපතිතුමාගේ අනුමැතීන්ට අනුව කපා හැර ඇති අතර ලැබිය යුතු ව්‍යාපෘති ආධාර ගිණුමේ ශේෂය වූ රු.26,331,555 කින් රු.10,439,170 කට අදාල තොරතුරු ලේඛනයේ දැක්වෙන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) මුදල් රෙගුලාසි 396 | 596,096 | මහජන බැංකු ජංගම ගිණුමට අදාලව 2019 පෙබරවාරි 28 දිනට නිකුත් කර තිබූ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබූ රු.596,096 ක් වටිනා චෙක්පත් 22 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.ඉන් රු.555,558 ක් වූ චෙක්පත් 14 ක් වර්ෂ 01 ක් ඉක්මවා තිබුණි. | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ලිපි මගින් දැනුම් දීමෙන් පසු නොපැමිණියහොත් ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 762 | 1,383,815 | යකඩ ද්‍රව්‍ය හා ගොඩනැගිලි ද්‍රව්‍ය තොග මට්ටම් පවත්වා ගෙන යාමේදී පමණට වඩා තොග තබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය තොග මට්ටම් පවත්වා ගැනීම කළ යුතු වේ. | අළුත්වැඩියා කළ යුතු මට්ටමේ වේලර් 08 ක් පැවතුන බැවින් එකී වේලර් අළුත්වැඩියා කිරීම සඳහා අදාළ යකඩ ප්‍රමාණය මිලදී ගත් බව දන්වා සිටිමි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.64,410,937 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.79,379,143 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මහජන බැංකු ජංගම ගිණුමෙහි බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවට ලැබී තිබූ රු.6,194,445 වූ ප්‍රේෂණ වටිනාකම හඳුනාගෙන නොතිබුණි. | සෘජු ප්‍රේෂණ හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | සියලු සෘජු ලැබීම් සඳහා අදාල ආයතන විසින් ලැබීම් තහවුරු කර ගත් පසු ලදු පත් මගින් ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ලංකා බැංකු ජංගම ගිණුමට අදාල රු.21,838 ක වටිනාකමක් හා මහජන බැංකු ගිණුමට අදාල රු.110,073ක වටිනාකමක් හඳුනාගෙන ගැලපුම් කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී බැංකු ගිණුම්වල පවතින සියලුම ගනුදෙනු හඳුනාගෙන ගැළපීම් කළ යුතු වේ. | ඉදිරි සති කීපය තුළ නිවැරදි කර බැංකු සැසඳුමට ගැළපීමට කටයුතු කරමි. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 |
| (i) | වරිපනම් හා බදු | 106,309 | 110,112 | 98,850 | 11,261 | 105,350 | 106,661 | 105,151 | 57,462 |
| (ii) | කුලී | 11,325 | 12,734 | 12,396 | 338 | 9,575 | 12,706 | 10,134 | 3,571 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,151 | 2,703 | 2,703 | - | 2,631 | 2,842 | 2,842 | 66 |
| (iv) | වෙනත් ආදායම් | 59,359 | 44,986 | 44,788 | 198 | 50,372 | 79,688 | 68,707 | 3,020 |

2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ආදායම වූ රු.57,462,219 කින් සමාලෝචිත වර්ෂය තුළ රු. 14,064,337 ක් අයකරගෙන තිබූ බැවින් හිඟ වරිපනම් අය කිරීම් | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තවදුරටත් පවතින හිඟ මුදල් අයකර ගැනීමේ වැඩසටහන් 2019 පෙබරවාරි මාසයේ සිටම ක්‍රියාත්මක කරනු ලබන අතර, මෙම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතින බව දන්වා |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිශතය සියයට 24 ක් වැනි අඩු මට්ටමක පැවතුණි. | | සිටිමි. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථානගත කර තිබූ සන්නිවේදන කුළුණු 11 කින් 2018 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.314,171 ක වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒ ඒ වර්ෂයේ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සන්නිවේදන කුළුණු 11 කින් 2019 වසරේ පළමු කාර්තුව වන විට රු.175,884ක් අයවීමට ඇති අතර රතු නිවේදන යැවීමටද කටයුතු කර ඇත. |

2.3.3 බලපත්‍ර ගාස්තු
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් හඳුනාගෙන තිබූ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ප්‍රධාන හෝටල් 03 කින් ආදායම මත සියයට 1 නොඉක්මවූ බලපත්‍ර ගාස්තුවක් වූ රු.18,083,263 ක් අයකර ගෙන නොතිබුණි. | නගර සභා ආඥා පනත අනුව ලියාපදිංචි සංචාරක හෝටල්වලින් ආදායම මත සියයට 01 ක නොඉක්මවූ බලපත්‍ර ගාස්තුවක් අයකර ගත යුතු වේ. | 2019 පෙබරවාරි 13 දින සාකච්ඡාවක් පැවති අතර එහිදී ඔවුන් විසින් පවසා සිටියේ සියයට 1 ක බලපත්‍ර ගාස්තුව සම්බන්ධයෙන් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හිමියන් කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් තීන්දුව ලැබෙන තුරු මෙම බලපත්‍ර ගාස්තු ගෙවිය නොහැකි බවයි. |

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

3.1 කාර්ය සාධනය
---------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම
------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ලියනගේමුල්ල පන්සල පාර රු.98,000 ක ඇස්තමේන්තු වටිනාකමකට නඩත්තු කටයුත්තක් සිදුකර තිබුණද, මාස 05 ක් වැනි කෙටි කාලයකින් මාර්ගයෙහි වූ ABC ගල් සහිත තාර කොටස් ගැලවී මාර්ගය භාවිතා කිරීමට දුෂ්කර පරිදි වලවල් සෑදී තිබුණි. | නියමිත ප්‍රමිතීන්ට අනුකූලව මාර්ග නඩත්තු කටයුතු සිදු කළ යුතු වේ. | අධික බර වාහන ගමන් කිරීම, ගුවන් තොටුපල විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කිරීම හා වර්ෂාව නිසා මාස 05 ක් වැනි කාල සීමාවක් තුළ මාර්ගය කැඩී වලවල් සෑදී ඇති බව දන්වමි. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම රු.346,943 ක් වූ උතුරු ලියනගේමුල්ල HPT වත්තේ සිට රේල් පාර දක්වා ඇති කොටස කොන්ක්‍රීට් කර සංවර්ධන කිරීමේ කර්මාන්තය 2017 පෙබරවාරි 29 වන දින කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබූ අතර ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්කරුගේ ස්ථානීය මිනුම් අතර නොගැළපීම් දක්වා 2018 අප්‍රේල් 23 වන දින මෙම කර්මාන්තය අවලංගු කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා යම් පිරිවැයක් දරා තිබියදී හා ගිවිසුම් ගතවී වර්ෂ 1 1/2 කට අධික කාලයක් ගතකර තිබියදී මෙම කර්මාන්තය අවලංගු කිරීමෙන් අදාල අරමුණු ඉටුකරගත නොහැකිවී තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරිමේදී මිනුම් හා වටිනාකම් නිවැරදිව ඇතුළත් කළ යුතු වේ. | ඇස්තමේන්තුව මුද්‍රණය කරන විට සිදුවූ දෝෂයක් නිසා එය ඇතිවී තිබෙන අතර ඉදිරියට එවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රයට අනුව සමාලෝචිත වර්ෂයේදී දිළිඳු බව පිටු දැකීම ඉලක්ක කර අම්බලන්මුල්ල මල් පෝච්චි නිෂ්පාදනය කරනු ලබන දිළිඳු අය තෝරාගෙන සිමෙන්ති ආධාර ලබාදීම සඳහා යෝජනාවක් සම්මත කරගෙන තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා විධිමත් සැලැස්මක් පිළියෙල කර එම ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට සභාවේ අනුමැතිය මත සමීක්ෂණයක් සිදු කර අම්බලන්මුල්ල ග්‍රාම සේවා වසම තුළ මල් පෝච්චි නිෂ්පාදනය කරනු ලබන දිළිඳු අය තෝරාගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අගෝස්තු 04 දින රු.586,174 ක් වැය කර අළුත්වැඩියා නිමකර තිබූ කටුනායක පොදු වෙළඳපොලේ ගව මස් කඩය පිහිටි ගොඩනැගිල්ල 2018 දෙසැම්බර් 31 දින වන විටත් විවෘත කර නොතිබුණි. | සභාව සතු වත්කම්වලින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | සභා තීරණයක් මගින් ටෙන්ඩර් කොට බදු දීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගර සභා ගොඩනැගිල්ලට මායිම්ව පෞද්ගලික ආයතනයක ගබඩාවට පිවිසීම සඳහා ක්‍රීඩාපිටිය මැදින් දිග මීටර් 131.9 ක් හා පළල මීටර් 7.5 ක් වූ මාර්ගයක් යොදා ගෙන තිබුණද මෙම මාර්ගය අදාල ආයතනයට පැවරීම සම්බන්ධ තොරතුරු තහවුරු නොවුනු හෙයින් සභාවේ වත්කම් බාහිර ආයතනවලට භාවිතා කිරීමට ඉඩදී තිබුණි. | නිසි අනුමැතියකින් තොරව සභාව සතු ඉඩම් බාහිර ආයතනවල පරිහරණය සඳහා ලබාදිය නොහැක. | තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය තිබූ කාලයේ සිටම මාර්ගයක් ලෙස භාවිතා කර ඇති අතර පසුව ප්‍රීමා ආයතනයද මෙම මාර්ගය ඒ ආකාරයටම භාවිතා කර ඇති බව දන්වමි. |
| (ඇ) | 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ නගර සභාවේ සේවා නියුක්තව සිටි ව්‍යාපෘති කම්කරුවන් 105 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් එම කාල සීමාවට අදාලව හිඟ අර්ථසාධක දායක මුදල් හා අධිභාර වශයෙන් රු.12,222,896 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | අධිභාර වශයෙන් ගෙවා ඇති මුදල් වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගත යුතුවේ. | හදිසි සේවා ව්‍යාපෘති සඳහා සේවකයන් බඳවා ගෙන ඔවුන්ට සභාව විසින් අනුමත කරන ලද දීමනාවක් පමණක් ගෙවා ඇති අතර ඒ සඳහා අර්ථසාධක දායක මුදල් ගෙවා නොමැත.2011 සිට 2017 දක්වා එම අර්ථසාධක අරමුදල් වෙනුවෙන් සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපිය අනුව අධිභාරද සමඟ ගෙවා ඇති බව දන්වමි. |
| (ඈ) | 2013 වර්ෂයේ ස්ථාන මාරුවී ගොස් තිබූ නිලධාරියෙකුගේ රු.24,940 ක අපදා හා උත්සව ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ණය ශේෂ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් විමසා ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------------ |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ජල බිල්පත් ගාස්තු වූ රු 11,804,184 ක වටිනාකම සඳහා කාල විශ්ලේෂණයක් ලබා ගැනීමේ හැකියාව (Facility) පරිගණක පැකේජය මඟින් සංවර්ධනය කර ගෙන නොතිබුණි. | පැකේජය තුළින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකියාව තිබිය යුතු වේ. | පරිගණකගත පැකේජය නිර්මාණය කරන ලද නෙක්ෆා ආයතනයට මෙයට පෙර දැනුම් දී ඇති අතර මෙතෙක් අවශ්‍ය පරිදි පැකේජය සංවර්ධනය කර නොමැත. |
| (ආ) | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීමට 2018 වර්ෂයේ රු. 17,774,368 ක් වැය කර තිබූ නමුත් ජලය බෙදා හැරීම මගින් වර්ෂයකදී ලබන ආදායම ගණනය කර නොතිබුණි. 2018 | ජලය බෙදාහැරීමේ බිල්පත් මාසිකව සකස් කරන බැවින් රැස්කළ වාර්ෂික ආදායම හඳුනාගත හැකි විය යුතු වේ. | ලාභ ලැබීමේ අරමුණින් නොව ප්‍රදේශයේ ජනතාවට පානීය ජල පහසුකම් ලබා දීමේ අරමුණින් ජල ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. |

නොවැම්බර් 28 දිනට පැවති රු. මිලියන 10 ඉක්මවා තිබූ හිඟ ජල ගාස්තු අයකර ගැනීමේ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගොඩනැගිලි සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයන් නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයන් නඩත්තු කළ යුතුවේ. | ගොඩනැගිලි වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරියේදී නඩත්තු කිරීමට කටයුතු කරමි. |

3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම සඳහා සභාව සතු කසගහවත්ත ඉඩමේ සම්පත් කේන්ද්‍රයක් ඉදිකර තිබූ අතර එම ප්‍රදේශයේ පසුව ඉදිකිරීම් ආරම්භ කරන ලද හෝටල් ව්‍යාපාරිකයන්ගේ විරෝධතාවය මත එම සම්පත් කේන්ද්‍රය භාවිතයට ගැනීමට සභාව විසින් නවතා තිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශාක්‍යතා අධ්‍යනයක් තුළින් එහි සාර්ථක අසාර්ථකත්වය හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය මත එහි කටයුතු නවතා ඇති බව හා නැවත සභාවෙන් විමසා කසළ වෙන් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ට්‍රැක්ටර් ට්‍රේලර් සෑදීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,383,815 ක් වටිනා යකඩ ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද වර්ෂය තුළ ට්‍රැක්ටර් ට්‍රේලර් අලුත් වැඩියා කිරීම හෝ ට්‍රේලර් සෑදීම් සිදුකර නොතිබුණි. ඒ අනුව වටිනාකම රු.1,017,000 ක් වූ යකඩ ද්‍රව්‍ය හා ගොඩනැගිලි ද්‍රව්‍ය අයිතම 05 ක තොගයක් 2018 දෙසැම්බර් 31 දිනට චලනය නොවූ තොග ලෙස ගබඩාවේ තිබුණි. එම තොග ගබඩාවෙන් නිකුත් කිරීමේදි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර නිකුත් කිරීමේ නියෝගවල සියලුම පිටපත් ගබඩා භාරකරු භාරයේම රඳවාගෙන තිබුණි. තවද අධීක්ෂණ නිලධාරීන්ගේ අනුමැතියකින් තොරව වැද්දුම් | අවශ්‍යතාවය අනුව ද්‍රව්‍ය මිලදී ගත යුතු අතර අනවශ්‍ය ලෙස තොග තබා නොගත යුතුවේ. තොග ලැබීම් හා නිකුත් කිරීම් විධිමත් විය යුතුවේ. | සභාවේ ඇති අළුත් වැඩියා කළ යුතු ට්‍රැක්ටර් ට්‍රේලර් අළුත් වැඩියා කිරීමටත් ප්‍රදේශයේ ඇති අනාරක්ෂිත බෝක්කු අත් වැට සැකසීම සඳහාද යකඩ මිලදී ගෙන ඇති අතර ගබඩා තොග විධිමත් ක්‍රමවේදයක් මත නිකුත් කිරීමට කටයුතු සිදු කිරීම සඳහා උපදෙස් දුන් බව දන්වමි |

| | | |
|---|---|---|
| ශිල්පියාගේ ඉල්ලීම මත පමණක් යකඩ ද්‍රව්‍ය ගබඩාවෙන් නිකුත් කර තිබුණි. | | |
| (ආ) ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ මාර්ග 10 ක් නඩත්තු කිරීම සඳහා CSS01 කොලාස් ලීටර් 3450 ක් කර්මාන්ත අංශයේ ලේඛන අනුව නිකුත් කර තිබුණි. නමුත් ගබඩා ලෙජරය හා ගබඩාව විසින් පවත්වාගෙන ගිය නිකුත් කිරීමේ නියෝගය අනුව 2018 වර්ෂය වෙනුවෙන් රු 33,120 ක් වටිනා CSS 01 තාර බැරල් 02 ක් (ලීටර් 400ක්) පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව ලෙජර,ගිණුම් හා තොග ලේඛනවලින් සත්‍ය භාවිතයන් හා සත්‍ය ශේෂයන් නිරූපණය නොවුණි. | ඇස්තමේන්තුවකට ද්‍රව්‍ය නිකුත් කිරීම නිසි සිදු කළ යුතුය. | තාර තොගයම එකවර කර්මාන්ත අංශය වෙත නිකුත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කළ බව හා එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.6 හඳුනාගත් පාඩු
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොන්ඩ්‍රඩ් ප්‍රේමතිරත්න මාවතේ වරිපනම් අංක 17 හිමිකරු විසින් වරිපනම් තක්සේරු ගාස්තු වැඩි කිරීමට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර සභා බලධාරින් නඩුවට ඉදිරිපත් නොවීම හේතුවෙන් උසාවිය විසින් 2014 සහ 2015 වර්ෂ සඳහා නව තක්සේරුවක් නිකුත් කිරීමටත් එහි ප්‍රතිඵලයක් ලෙස බදු ගාස්තු ඉහළ දැමීමට ගත් තීරණ අවලංගු කිරීමට තීරණය කර තිබුණි.ඉහත දේපලට අදාල රු,2,991,750 ක හිඟ වරිපනම් ආදායම් ශේෂයක් ආදායමින් ඉවත් කිරීමට කටයුතු කිරීමට සිදුව තිබූ අතර නීති ගාස්තු ඇතුළුව රු.3,015,750 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි. | නීතිමය කටයුතුවලදී ශක්තිමත් සාක්ෂි ඉදිරිපත් කරමින් නඩු කටයුතුවලට නිසි ලෙස පෙනී සිටීම සභාව සතු වගකීමකි. | වරිපනම් තක්සේරුවට විරුද්ධව අදාල ආයතනය විසින් සභාවට විරුද්ධව නඩු පවරා තිබූ අතර අධිකරණය ලබාදී තිබූ තීන්දුව අනුව රු.2,991,751 ක් කපා හැරීමට කටයුතු කළ බව දන්වමි. |

3.7 ප්‍රසම්පාදනය
-------------

3.7.1 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඩවීන්ද්‍ර මෙන්ඩිස් ක්‍රීඩාංගණයේ පිටිය සැකසීම හා අත්වැට ඉදිකිරීමට එකතු කළ අගය මත බදු රහිතව රු.562,524 කට ඇස්තමේන්තු සකස්කර තිබූ අතර රු.460,190 කට ටෙන්ඩර් පිරිනමා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 ප්‍රකාරව විචලනයන් සඳහා හේතු දැක්වීමක් සිදු කළ යුතු අතර ව්‍යාපෘතියක් ආරම්භ | ක්‍රීඩා පිටිය භාවිතා කරන ක්‍රීඩකයන් පිරිසකගේ විරුද්ධතාවය මත ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවූ අතර ක්‍රීඩකයන්ගේ එකඟතාව ලබා ගෙන මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සිදුකළ |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඇස්තමේන්තු මුදල හා ටෙන්ඩර්කරු එකඟ වූ මිල අතර විචලනය රු.100,334 ක් එනම් සියයට 17.8 ක් වී තිබූ හෙයින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 ප්‍රකාරව විචලනයන් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි. 2018 මාර්තු 29 දින මෙම ව්‍යාපෘතිය නිම විය යුතු වුවද කිසිදු සාධාරණ හේතුවකින් තොරව දින දීර්ඝ කර තිබූ අතර 2018 ජුනි 02 දින වන විටත් නිම කර නොතිබුණි. | කිරීමට පෙර ඇතිවිය හැකි ගැටලු පිළිබඳව සභාව විසින් නිසි අවධානය යොමු කළ යුතුවේ. | හැකි බව දන්වමි. |
| (ආ) | ජයවර්ධනපුර බහුකාර්යය ගොඩනැගිල්ල රු3,517,924 ක් වැයකර ඉදිකිරීම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ප්‍රයෝජනයක් ගත හැකි ලෙස නිමවා නොතිබුණි. 2018 ජනවාරි 19 දිනැති අංක CSO/PLN/MA09/01/47 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මාර්ගොපදේශ 7 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති වාර්තාව ආරම්භයේදි අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති වාර්තාව, නිමකිරීමට බලාපොරොත්තු වන කාලය සහ මූල්‍ය ශක්‍යතාවය හඳුනා ගෙන සැලැස්මක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රමාණවත් මුදල් නොමැති නිසා වරින් වර ලැබෙන මුදල් යොදවා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කර තිබෙන අතර සංවර්ධන ව්‍යාපෘති ඇස්තමේන්තු සහතික කිරීමේ සීමාව වන රු.මිලියන 2.5 ඉක්මවා ප්‍රතිපාදන ලැබී නොමැති බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ රු 32,714,033 ක් වටිනා සභා අරමුදල් කර්මාන්ත ව්‍යාපෘති 57 ක් සඳහා ගිවිසුම් අත්සන් කර හදිසි ප්‍රසම්පාදන අවශ්‍යතාවය අනුව කිරීමට සභා අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සඳහා කල්වේලා ඇතිව සැලසුම් සහගත ලෙස කටයුතු කිරීමට හැකිව තිබියදී හදිසි අවශ්‍යතාවයක් ලෙස සළකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.1 (අ)(I) හා (ii) අනුව කටයුතු කර තිබුණි.2018 දෙසැම්බර් 31 දින තුළදී මිල ගණන් ලබා ගැනීම,ටෙන්ඩර් විවෘත කිරීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ගිවිසුම් ගත වීම හා කාර්ය සාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීම එකම දිනයකදි සිදු කර තිබුණි. | 2018 වර්ෂය සඳහා සභා අරමුදල් මගින් ප්‍රතිපාදන වෙන්කර ගත් ව්‍යාපෘති එම වර්ෂය තුළ සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුනහොත් ප්‍රතිපාදන අවිච්ඡේද කිරීමට නොහැකි නිසාද 2018 සැප්තැම්බර් 27 දින සභාවට ඉදිරිපත් කළද දේශපාලන අස්ථාවරත්වය මත එය ප්‍රතික්ෂේපවූ නිසාද 2018 දෙසැම්බර් 27 දින විශේෂ සභා අනුමැතියක් මත 2018 දෙසැම්බර් 31 දින හදිසි අවශ්‍යතාවයක් සේ සලකා ව්‍යාපෘති 57 ක ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් පිරිනමා ගිවිසුම් අත්සන් කළ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කුලී පදනම මත පැය 200ක කාලයක් සඳහා D5D යන්ත්‍රයක් ලබා ගැනීමට මිල ගණන් කැඳවා තිබූ අතර රු 5,500 මිලට යන්ත්‍රය ලබාගෙන තිබුණි. නමුත් දිස්ත්‍රික් මිල කමිටු තීරණය අනුව D5D වර්ගයේ යන්ත්‍රයක් සඳහා මීටර් පැයකට රු 4,750 ක් නියම කර තිබූ හෙයින් මීටර් පැයකට රු 750 ක් බැගින් රු. 150,000 ක් වැඩිපුර ගෙවීමක් කර තිබුණි. | දිස්ත්‍රිත් මිල කමිටු විසින් තීරණය කර ඇති මිල ගණන් සැලකිල්ලට ගත යුතුවේ. | දිස්ත්‍රිත් මිල කමිටු මිල ගණන් තීරණය කර ඇත්තේ 2017 වර්ෂය අවසානයේදී බැවින් ඉන්ධන මිල ඉහල යාමද සලකා ආයතන විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගෙන ඇති බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය සංකේත අංක 440 සඳහා වැය මාරුකිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු.18,758,867 ක් වූ අතර මුළු වියදම රු.23,399,323 ක් විය. ඒ අනුව ප්‍රතිපාදනය ඉක්මවූ වියදම රු.4,640,457 ක් විය. | වැය ප්‍රතිපාදන නිසි පරිදි කළමනාකරණය කළ යුතුවේ. | ඉදිරියේදි වැය ප්‍රතිපාදන කළමනාකරණය නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව දන්වමි. |